# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 422 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 10/03/2024<br>පැය 1330 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - එගොඩඋයන පොලිස් වසම.**

2022.02.25 වන දින එගොඩඋයන පොලිස් වසමේ නිවසකට අයුතු ලෙස ඇතුළු වී නිවසේ සිටි කාන්තාවකට ගිනි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සම්බන්ධයෙන් එගොඩඋයන පොලිස් ස්ථානය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු 2024.03.09 වන දින අත්අඩංගුවට ගෙන එගොඩඋයන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කටුකුරුන්ද, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එගොඩඋයන පොලිසිය මඟින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් ස්ථානය.**

2024.03.09 වන දින උදෑසන කාලයේදී නිකවැරටිය පොලිස් වසමේ දිවුල්ලෑගොඩ ප්‍රදේශයේදී නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නිකවැරටිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.
ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන දිවුල්ලෑගොඩ, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බුලත්කොහුපිටිය පොලිස් ස්ථානය.**

2024.03.09 වන දින සවස් කාලයේදී බුලත්කොහුපිටිය පොලිස් වසමේ අඹමල්ල, බුලත්කොහුපිටිය ප්‍රදේශයේදී බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන අඹමල්ල, බුලත්කොහුපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බුලත්කොහුපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.